WWW.OLEVELAPI.COM

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019 දෙසැම්බර්
## 44 - නැටුම් (දේශීය)
## අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය : බහුවරණ ප්‍රශ්න 40කි. (40 x 1) **ලකුණු 40යි.**

II පත්‍රය : 1 වැනි ප්‍රශ්නය කොටස් 10කි. කෙටි පිළිතුරු

1 - 8 දක්වා (8 x 1) ලකුණු 08
8 - 10 දක්වා (2 x 2) ලකුණු 04 } **ලකුණු 12යි.**

**සෙසු ප්‍රශ්න 6න් (2 - 7 තෙක්) තෝරාගත් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුයි.**

| | | | |
|---|---|---|---|
| 2 වැනි ප්‍රශ්නය | i ලකුණු 4 | | |
| | ii ලකුණු 4 | | |
| | iii ලකුණු 4 | ලකුණු 12යි. | |
| 3 වැනි ප්‍රශ්නය | i ලකුණු 4 | | |
| | ii ලකුණු 4 | | |
| | iii ලකුණු 4 | ලකුණු 12යි. | |
| 4 වැනි ප්‍රශ්නය | i ලකුණු 4 | | |
| | ii ලකුණු 4 | | |
| | iii ලකුණු 4 | ලකුණු 12යි. | |
| 5 වැනි ප්‍රශ්නය | i ලකුණු 4 | | **12x4 = ලකුණු 48යි.** |
| | ii ලකුණු 4 | | |
| | iii ලකුණු 4 | ලකුණු 12යි. | |
| 6 වැනි ප්‍රශ්නය | i ලකුණු 4 | | |
| | ii ලකුණු 4 | | |
| | iii ලකුණු 4 | ලකුණු 12යි. | |
| 7 වැනි ප්‍රශ්නය | i ලකුණු 4 | | |
| | ii ලකුණු 4 | | |
| | iii ලකුණු 4 | ලකුණු 12යි. | |

WWW.OLEVELAPI.COM

**මුළු ලකුණු 100යි.**

- පළමු සහ දෙවන පත්‍රවල ලකුණු දැමීම
- පළමු පත්‍රයේ කවුළුපත් ලකුණු කිරීමේ දී, අදාළ ප්‍රශ්න අංකය ඉදිරියේ හරි වැරදි ලකුණු කරන්න.
- නිවැරදි ලකුණු ගණනය කොට අදාළ පේළිය යට කොටුවෙහි මුළු සංඛ්‍යාව සටහන් කරන්න.
- දෙවන පත්‍රයේ කොටස් ලකුණු දකුණු පස ඇති තීරුවේ ලියා දක්වන්න.
- එක් එක් ප්‍රශ්නයේ කොටස්වලට ලද ලකුණු උත්තරයේ අග ලියා එකතු කොට එය දකුණු පස තීරුවේ ලියා ඒ වටා රවුමක් අඳින්න



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එක ම පිළිතුරක් වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කරන ලැබ ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කරනු ලැබ ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නො ලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ප්‍රමාණය ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

WWW.OLEVELAPI.COM

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සෑම විට ම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 44 - නැටුම් (දේශීය)

## I සහ II ප්‍රශ්න පත්‍රයන්හි අභිමතාර්ථ

1. දේශීය නර්තන සම්ප්‍රදායන්හි සිද්ධාන්ත, ඓතිහාසික තොරතුරු හා සංස්කෘතික පසුබිම පිළිබඳ දැනුම පිරික්සීම.

2. රසභාව හා බැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් ඒවා වර්ග කර දැක්වීමේ අවබෝධය පිරික්සීම.

3. විෂය නිර්දේශයන්හි අන්තර්ගත ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල හැකියා පිළිබඳ පරීක්ෂා කිරීම.

4. භාරතීය නර්තන සම්ප්‍රදායන්ගේ තොරතුරු සංස්ලේෂණය කිරීමේ හැකියාව මැන බැලීම.

5. විෂය කරුණු යටතේ ඇති රූප සටහන් නිරීක්ෂණය හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම.

6. නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික සුවතාව පිළිබඳ අවබෝධය පිරික්සීම.

7. නර්තන කලාව හා බැඳි විවිධ කලා මාධ්‍යයන් පිළිබඳ විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව පිරික්සීම.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

2019.12.10 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

※ සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

※ **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** මූලික සරඹ පුහුණු වීමේ දී තාල අවබෝධය සඳහා ............................ භාවිතය වඩාත් වැදගත් වේ.
(1) විලම්භලය (2) මධ්‍යලය (3) ද්‍රැතලය (4) ත්‍රිවිධලය

**2.** "උන් තැන අටයි තරිකිට දොං දොං තා .. .. .. .." මෙම පද කොටස අයත් ගායනය ......................... කි.
(1) වන්නම (2) සවුදම (3) ටීකාව (4) යාතිකාව

**3.** දේශීය මුද්‍රා නාට්‍යයක් වන ............................ චිත්‍රසේන විසින් නිර්මාණය කරන ලදී.
(1) චණ්ඩාලිකා (2) රන්දද (3) කුණ්ඩලකේශි (4) සත්පත්තිනි

**4.** නර්තනයේ දී වේෂ නිරූපණය අයත් වන්නේ ............................ අභිනයට ය.
(1) ආංගික (2) වාචික (3) සාත්වික (4) ආහාර්ය

**5.** කොහොඹාකංකාරියේ දක්නට ලැබෙන අංගයක් වන ............................ නාට්‍යමය ලක්ෂණ සහිත වේ.
(1) මීබන්ධනය (2) ගුරුගේ මාලාව (3) ඇත්බන්ධනය (4) බත් මාලාව

**6.** ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් ශ්‍රී ලංකාවට පැමිණියේ ............................ යුගයේ දී ය.
(1) කෝට්ටේ (2) කොළඹ (3) මහනුවර (4) ගම්පළ

**7.** මනිපුරි සම්ප්‍රදායේ බෙර පැළඳ නර්තනයේ යෙදෙනු ලබන්නේ ......................... නර්තනාංගයේ දී ය.
(1) චෙංගිලම් (2) පුං චොලම් (3) මද්දලම් (4) කණ්ඩිලම්



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**8.** කථකලි නර්තනයේ දී හාස්‍යෝත්පාද ගණයට අයත් චරිත සඳහා ............................ වේෂ නිරූපණ ක්‍රමය භාවිත කරයි.
(1) මිනික්කු (2) පච්චා (3) කත්ති (4) කාරි

**9.** "මේරුං විරාජිත සමං" ........................ ගායනයක් ලෙස සඳහන් කළ හැකි ය.
(1) ආඝාතාත්මක (2) අනාඝාතාත්මක (3) තාලාත්මක (4) කලාත්මක

**10.** කෝලම් නාටකයේ .................................... පූර්ව රංගයට අයත් අංගයකි.
(1) නාරිලතා කෝලම (2) ආරච්චි කෝලම (3) මනමේ කෝලම (4) ගිරිදේවි කෝලම

**11.** ආංගික අභිනයේ දී බෙල්ල, උරබාහු, වැලමිටි, මැණික් කටුව අයත් වන්නේ,
(1) අංගවලට ය. (2) ප්‍රත්‍යාංගවලට ය. (3) උපාංගවලට ය. (4) නවාංගවලට ය.

**12.** පොළොන්නරු යුගයේ දී මහා පරාක්‍රමබාහු රජු විසින් නැටුම්, ගැයුම්, වැයුම් සඳහා ඉදිකරනු ලැබූ මණ්ඩපය වන්නේ,
(1) සරස්වතී මණ්ඩපයයි. (2) ශෘංගාර මණ්ඩපයයි.
(3) නිශ්ශංක ලතා මණ්ඩපයයි. (4) කවිකාර මණ්ඩපයයි.

**13.** රති හා ක්‍රෝධය යන භාවයන් තුළින් ජනිත වන්නේ,
(1) ශෘංගාර හා රෞද්‍ර රසයන් ය. (2) කරුණා හා හාස්‍ය රසයන් ය.
(3) ශෘංගාර හා අද්භූත රසයන් ය. (4) වීර හා රෞද්‍ර රසයන් ය.

**14.** හඟුරන්කෙත, මාතලේ, බදුල්ල දිස්ත්‍රික්කවල ප්‍රචලිතව ඇති ගැමි නාටකය වන්නේ,
(1) කෝලම් ය. (2) නාඩගම් ය. (3) සොකරි ය. (4) රූකඩ ය.

**15.** මල් මඩුපුරය, වාහල හා දුනුමාලප්පුව යන අංග පිළිවෙළින් දක්නට ලැබෙන්නේ,
(1) පහන්මඩුව, දෙවොල්මඩුව හා යක්මඩුවෙහි ය.
(2) පහන්මඩුව, කොහොඹාකංකාරිය හා දෙවොල්මඩුවෙහි ය.
(3) පහන්මඩුව, දෙවොල්මඩුව හා කොහොඹාකංකාරියෙහි ය.
(4) රටයකුම, දෙවොල්මඩුව හා කොහොඹාකංකාරියෙහි ය.

**16.** ගායනා සහිත නර්තන අංග ඇතුළත් වරණය තෝරන්න.
(1) කොහොඹාහැල්ල, තොරන් යාගය, මුගුරුපද (2) කොහොඹාහැල්ල, තොරන් යාගය, දෙවොල්
(3) කොහොඹාහැල්ල, පත්තිනි, කොලොන්න පද (4) පත්තිනි, තොරන් යාගය, කොලොන්න පද

**17.** කොහොඹාකංකාරිය ශාන්තිකර්මයේ දක්නට ලැබෙන සැරසිලි වනුයේ,
(1) යහන, අයිලය හා යක්ගෙය ය. (2) යහන, අයිලය හා තොරණ ය.
(3) යහන, අයිලය හා කාලපන්දම් ගස ය. (4) යහන, අයිලය හා බිසෝකප ය.

**18.** ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට දායක වූ භාරතීය පඬිවරයකු වන්නේ,
(1) ශාන්ති දේව්ඝොෂ් ය. (2) උදය ශංකර් ය.
(3) රවීන්ද්‍රනාත් තාගෝර් ය. (4) ගෝපිනාත් ය.

**19.** කථකලි නර්තනයේ ගීත ගායනා කරනු ලබන්නේ,
(1) හින්දි හා දෙමළ බසිනි. (2) දෙමළ හා සංස්කෘත බසිනි.
(3) සංස්කෘත හා මලයාලම් බසිනි. (4) මලයාලම් හා හින්දි බසිනි.

**20.** කෝලම් චරිත රඟමඩලට පිවිසීමේ දී හඳුන්වාදෙනු ලබන්නේ,
(1) ආරච්චිල විසිනි. (2) බෙරවාදකයන් විසිනි.
(3) අණබෙරකරු විසිනි. (4) කාරියකරවන රාළ විසිනි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

● අංක **21** සිට **24** දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු පහත දැක්වෙන පින්තූර ඇසුරෙන් තෝරන්න.


A


B


C


D

**21.** හපනා, ගිනිහොරා හා රන්කිකිළි යන මුද්‍රානාට්‍ය නිර්මාපකයාගේ ඡායාරූපයට අදාළ අක්ෂරය වන්නේ,
(1) A ය. (2) B ය.
(3) C ය. (4) D ය.

**22.** රජයේ ලලිත කලායතනයේ ප්‍රථම විදුහල්පතිවරයා/වරියගේ ඡායාරූපයට අදාළ අක්ෂරය වන්නේ,
(1) A ය. (2) B ය.
(3) C ය. (4) D ය.

**23.** කරදිය මුද්‍රානාට්‍යයේ මන්නඩි රාළ හා සිසිගේ චරිත රඟපෑ ශිල්පීන්ගේ ඡායාරූපවලට අදාළ අක්ෂර වන්නේ පිළිවෙළින්,
(1) A හා B ය. (2) B හා A ය.
(3) B හා C ය. (4) D හා C ය.

**24.** ස්වර්ණ තිලකා හා ග්‍රහ අපලය යන මුද්‍රානාට්‍ය නිර්මාණකරුවන්ගේ ඡායාරූපවලට අදාළ අක්ෂර වන්නේ පිළිවෙළින්,
(1) A හා B ය. (2) B හා A ය.
(3) B හා C ය. (4) C හා D ය.

● ප්‍රශ්න අංක **25** සිට **27** දක්වා නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A | මෙලෙයි යකුන් පිදීම | හඟල යැදීම | මීල්ල කැපීම |
| B | කොහොඹා දෙවි | පත්තිනි | දෙවොල් |
| C | වැදි යක්කම | පොත්කඩේ පාළිය | රාමා මැරීම |

**25.** කොහොඹාකංකාරිය ශාන්තිකර්මයට ආවේණික චාරිත්‍ර විධි සඳහන් වන්නේ,
(1) A තීරුවේ 1 හා 2 හි ය. (2) A තීරුවේ 1 හා 3 හි ය.
(3) A තීරුවේ 2 හා 3 හි ය. (4) C තීරුවේ 1 හා 3 හි ය.

WWW.OLEVELAPI.COM

**26.** දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම දෙකෙහිම පුද ලබන දෙවිවරු සඳහන් වන්නේ,
(1) B තීරුවේ 1 හා 2 හි ය. (2) B තීරුවේ 1 හා 3 හි ය
(3) B තීරුවේ 2 හා 3 හි ය (4) C තීරුවේ 1 හා 3 හි ය

**27.** පහන් මඩුව ශාන්තිකර්මයේ දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාලි ඇතුළත් වන්නේ,
(1) A තීරුවේ 1 හා 2 හි ය. (2) C තීරුවේ 1 හා 2 හි ය.
(3) C තීරුවේ 1 හා 3 හි ය. (4) C තීරුවේ 2 හා 3 හි ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**28.** පහත සඳහන් ඡායාරූපයෙහි දැක්වෙන්නේ,



(1) අඹ විදමනයි.
(2) රාම මැරීමයි.
(3) ගරා නැටීමයි.
(4) ආඬිගුරු නැටීමයි.

**29.** මනිපුරි නර්තනයේ කාන්තා රංග වස්ත්‍ර වන කුමින් හා මයිකුම් පළඳිනු ලබන්නේ පිළිවෙළින්,
(1) හිසට හා ඉණට ය.
(2) ඉඟටියට හා හිසට ය.
(3) දැතට හා කණට ය.
(4) හිසට හා උඩුකයට ය.

**30.** කථකලි නර්තනයේ ප්‍රධාන ගායකයා සහ අනුගායකයා හඳුන්වනු ලබන්නේ පිළිවෙළින්,
(1) පොන්නානි හා සිංකිටි ලෙස ය.
(2) පොන්නානි හා වඩිවේලු ලෙස ය.
(3) වඩිවේලු හා ශිවනාදන් ලෙස ය.
(4) ශිවනාදන් හා පොන්නානි ලෙස ය.

## II කොටස - උඩරට නර්තනය

**31.** අටවන ගොඩ සරඹය ලෙස හඳුන්වන්නේ,
(1) ඇල සරඹයයි.
(2) අර්ධ චක්‍ර සරඹයයි.
(3) චන්ද්‍රිකා සරඹයයි.
(4) දෑත පෑගීමේ සරඹයයි.

**32.** 'දොං දොං ජිං ............' බෙර පදයේ ඉතිරි කොටස කුමක් ද?
(1) තකු දොං
(2) තරිකිට තකු දොං
(3) ජිං ගජිගත
(4) කුඳ ගත දොං

**33.** මුසලඩි වන්නමට අයත් බෙර පදය දැක්වෙන වරණය තෝරන්න.
(1) ජිං තරිකිට තත් දොම්කිට
(2) දොං ජිං ජිං ගජිගත
(3) දොංතකු දොං ජිංතක
(4) දෝං ජිං ජිං තකට දොංතක

WWW.OLEVELAPI.COM

**34.** උඩරට නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලය ලෙස හඳුන්වන්නේ,
(1) තනි කච්චි ඇඳුම් කට්ටලයයි.
(2) බෙර ඇඳුම් කට්ටලයයි.
(3) වෙස් ඇඳුම් කට්ටලයයි.
(4) නෛයඩි ඇඳුම් කට්ටලයයි.

**35.** මාත්‍රා 3 + 4 දෙතිතට අයත් කස්තිරමක් ඇතුළත් වරණය කුමක් ද?
(1) රුඳග ජිත් තක තකට කුංදත් ...........
(2) රුඳ ගජිත රුඳ ගජිත ...........
(3) රුංතක ජිංතක ජිංතක ජිංකුඳ ...........
(4) රුඳ ගත ගත ගත කුකුඳත් ...........

**36.** උඩරට වන්නමකට අයත් කොටස් ගණන
(1) තුනකි.
(2) හතරකි.
(3) පහකි.
(4) හයකි.

**37.** ගැට බෙරයෙහි කොටස් දෙකක් වන්නේ,
(1) වලයම හා සුරත් තට්ටුව ය.
(2) වෙනිවර සහ සුරත් තට්ටුව ය.
(3) කැපුම් හම සහ අඬ බැය ය.
(4) මණ්ඩම සහ සුරත් තට්ටුව ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**38.** 'තත් තකට තක රොං' මෙය,
(1) හනුමා වන්නමේ අඩව්වකි. (2) මුසලඩි වන්නමේ අඩව්වකි.
(3) තුරඟා වන්නමේ අඩව්වකි. (4) සිංහරාජ වන්නමේ අඩව්වකි.

**39.** උඩරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කළ ප්‍රවීණ ශිල්පියෙක් වන්නේ,
(1) එස්. පණිභාරත ය. (2) කේ. ඈස්. ප්‍රනාන්දු ය.
(3) සව්රිස් සිල්වා ය. (4) රද්දැල්ලේ පොඩි මහත්තයා ය.

**40.** 'සිංහල නර්තන කලාව' ග්‍රන්ථය පළ කරන ලද්දේ,
(1) මහාචාර්ය තිස්ස කාරියවසම් විසිනි. (2) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ විසිනි.
(3) මහාචාර්ය ලයනල් බෙන්තරගේ විසිනි. (4) මහාචාර්ය මුදියන්සේ දිසානායක විසිනි.

## III කොටස - පහතරට නර්තනය

**31.** අටවන ඉලංගම් සරඹය කුමක් ද?
(1) දොංගත දිතගත ගත් දැහිං (2) ගුං දැහිං // ගත්තත් දොම් දිතගත
(3) තරිකඩ දිරිකඩ (4) තෙයියත් තරිකිට තෙයියත් දිගතම්

**32.** 'දොම් තම් ගත ...........' බෙර පදයේ ඉතිරි කොටස කුමක් ද?
(1) දොම් තරිකිට (2) ගුං ගුං දැහිං
(3) ගදිතම් ගත (4) ගුද ගදි කිට

**33.** ශුද්ධ තාලයට අයත් බෙර පදය දැක්වෙන වරණය තෝරන්න.
(1) දොම් දොම් ගදි කිට (2) තකදින් තකදොම්
(3) ගුදිත ගුදම් ගත (4) දිත්තම් දිතම් දොම් දොම් තාම්

**34.** පහතරට නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ,
(1) නානුමුර ඇඳුම් කට්ටලයයි. (2) බලි ඇඳුම් කට්ටලයයි.
(3) තෙල්මේ ඇඳුම් කට්ටලයයි. (4) බෙර ඇඳුම් කට්ටලයයි.

**35.** මාත්‍රා 2 + 4 දෙතිතට අයත් ඉරට්ටියක් ඇතුළත් වරණය කුමක් ද?
(1) දොම් තත් දිම් ගත ගුගුදිත ..... (2) තකදිත් තත් දොම් කිත්තත් .....
(3) තත් ගුද ගත දිත් දිත් තෙයි ..... (4) දොම් තගදිත ගත .....

**36.** පහතරට සින්දු වන්නමකට අයත් කොටස් ගණන
(1) හතකි. (2) හයකි. (3) පහකි. (4) හතරකි.

**37.** පහතරට බෙරයෙහි කොටස් දෙකක් වන්නේ,
(1) වෙනිවර සහ සුරත් තට්ටුව ය. (2) හයි තට්ටුව සහ වෙනිවර ය.
(3) කැපුම් හම සහ බෙර පුහුල ය. (4) හයි තට්ටුව සහ සුරත් තට්ටුව ය.

WWW.OLEVELAPI.COM

**38.** 'තත් ගුද ගත දිත් දිත් තෙයි' මෙය,
(1) අනුරාගදණ්ඩ තාලයේ ඉරට්ටියකි. (2) ලලිත රාග තාලයේ ඉරට්ටියකි.
(3) ශුද්ධ තාලයේ ඉරට්ටියකි. (4) නාතිලිංචි තාලයේ ඉරට්ටියකි.

**39.** පහතරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කළ ප්‍රවීණ ශිල්පියෙක් වන්නේ,
(1) කේ. ඈස්. ප්‍රනාන්දු ය. (2) රද්දැල්ලේ පොඩි මහත්තයා ය.
(3) එස්. පණිභාරත ය. (4) එන්. සිරිබෝහාමි ය.

**40.** 'ශාන්තිකර්ම සහ සිංහල සමාජය' ග්‍රන්ථය පළ කරන ලද්දේ,
(1) මහාචාර්ය මුදියන්සේ දිසානායක විසිනි. (2) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ විසිනි.
(3) මහාචාර්ය ලයනල් බෙන්තරගේ විසිනි. (4) මහාචාර්ය තිස්ස කාරියවසම් විසිනි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## IV කොටස - සබරගමු නර්තනය

**31.** දහවන දොඹින පදය කුමක් ද?
(1) කර තත් තක්කිට.......
(2) කිත්තා කිත්තා ජෙජ් ජෙං තා.......
(3) තෙයියත් තා දොම්.......
(4) කිට තරිකිට ගතත්ත........

**32.** 'කුඳත් තක්කිට.........' දවුල් පදයේ ඉතිරි කොටස කුමක් ද?
(1) තක්කිට තරිකිට
(2) ජිමිත කුදා දොම්
(3) තකට ජිමිත කු
(4) ගත්තකු ජිත්තත්

**33.** විරාඩි වන්නමට අයත් දවුල් පදය දැක්වෙන වරණය තෝරන්න.
(1) ජිංත කුඳත් තත් තකට
(2) ජිං ත ජිමිත්තත් තක්කිට තරිකිට
(3) කුඳත් තක්කිට තකට ජිමිතකු
(4) ජිමිතකුදා දොම්

**34.** සබරගමු නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලය ලෙස හඳුන්වන්නේ,
(1) ශුද්ධ මාත්‍රා ඇඳුම් කට්ටලයයි.
(2) බලි ඇඳුම් කට්ටලයයි.
(3) පබළු ඇඳුම් කට්ටලයයි.
(4) බෙර ඇඳුම් කට්ටලයයි.

**35.** මාත්‍රා 3 + 4 දෙතිතට අයත් කලාසමක් ඇතුළත් වරණය කුමක් ද?
(1) ජිංත ගත ගත ගදිත කුද කුද.......
(2) කුදිත ගතිත කුද ගතිගත කුද ගත.......
(3) කුදිත ගත ගත ගදිත කුද කුද.......
(4) කුඳ කුද ගත ගත ///.......

**36.** සබරගමු වන්නමකට අයත් කොටස් ගණන
(1) හතකි.
(2) හයකි.
(3) හතරකි.
(4) පහකි.

**37.** දවුලෙහි කොටස් දෙකක් වන්නේ,
(1) මණ්ඩම සහ තට්ටුව ය.
(2) ගැටිය සහ තට්ටුව ය.
(3) ගැටිය සහ සුරත් තට්ටුව ය.
(4) ගැටිය සහ හැක්ම ය.

**38.** 'ජිංත ගත් තත් ගතිත ගත දොම්' මෙය,
(1) විරාඩි වන්නමේ අඩව්වකි.
(2) කොවුලා වන්නමේ අඩව්වකි.
(3) මණ්ඩුක වන්නමේ අඩව්වකි.
(4) අනිලා වන්නමේ අඩව්වකි.

**39.** සබරගමු නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කළ ප්‍රවීණ ශිල්පියෙක් වන්නේ,
(1) රද්දැල්ලේ පොඩි මහත්තයා ය.
(2) කේ. එස්. ප්‍රනාන්දු ය.
(3) එස්. පණිභාරත ය.
(4) සව්රිස් සිල්වා ය.

**40.** 'සබරගමු නර්තන කලාව' ග්‍රන්ථය පළ කරන ලද්දේ,
(1) මහාචාර්ය මුදියන්සේ දිසානායක විසිනි.
(2) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ විසිනි.
(3) මහාචාර්ය තිස්ස කාරියවසම් විසිනි.
(4) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ විසිනි.

WWW.OLEVELAPI.COM

* *



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2019**
**க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019**

| විෂයය අංකය<br>பாட இலக்கம் | 44 | විෂයය<br>பாடம் | නැටුම් (දේශීය) |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 2 | 21. | 1 | 31. | 2 |
| 2. | 3 | 12. | 1 | 22. | 4 | 32. | 3 |
| 3. | 1 | 13. | 1 | 23. | 2 | 33. | 4 |
| 4. | 4 | 14. | 3 | 24. | 4 | 34. | 3 |
| 5. | 2 | 15. | 3 | 25. | 1 | 35. | 1 |
| 6. | 3 | 16. | 2 | 26. | 3 | 36. | 4 |
| 7. | 2 | 17. | 1 | 27. | 4 | 37. | 2 |
| 8. | 4 | 18. | 3 | 28. | 1 | 38. | 3 |
| 9. | 2 | 19. | 3 | 29. | 2 | 39. | 1 |
| 10. | 2 | 20. | 4 | 30. | 1 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25<br>40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25<br>40 |
|---|---|---|---|



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

※ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **12** බැගින් හිමි වේ.

**1.** **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) පාසල් විෂයමාලාවට සෞන්දර්ය විෂය අනිවාර්ය වූයේ .................................. වසරේ සිට ය.

(ii) කවිකාර මඩුවේ දී වන්නම් ප්‍රබන්ධ කොට රජුගෙන් ගම්වර ලබා ගත්තේ .................................. අධිකාරම්තුමා ය.

(iii) 'එදා හෙළදිව' කෘතිය රචනා කරන ලද්දේ .................................. විසිනි.

(iv) ලී දැතට රැගෙන කනුවක් වටේ රටා මවමින් නර්තනය කරන ද්‍රවිඩ ගැමි නැටුම .................................. නමින් හැඳින්වේ.

(v) නන්දිකේශ්වර විසින් රචිත කෘතිය හඳුන්වනු ලබන්නේ .................................. නමිනි.

(vi) බලි ශාන්තිකර්මවල පුද ලබන නව ග්‍රහයන් වන්නේ ඉරු, සිකුරු, අඟහරු, රාහු, .................................. සඳු, බුද, ගුරු, කෙහෙතු ය.

(vii) මහාවංශය අනුව .................................. රජු ඉදිරියේ 'දෙව් මිනිස් නැටුම්' කර වූ බව ඉතිහාසයේ සඳහන් වේ.

(viii) රාජ ආඥාවක් සන්නිවේදනය කිරීමට අතීතයේ දී .................................. වාදනය කරන ලදී.

(ix) සතර බීජාක්ෂර අතුරෙන් හුරු හා නුහුරු අතින් වාදනය කරන අක්ෂර මොනවා ද?
(අ) හුරු අතින් - ..........................................
(ආ) නුහුරු අතින් - ..........................................

(x) කෝලම් නාටකයේ භාවිත වන අතත හා සුෂිර වාද්‍ය භාණ්ඩ මොනවා ද?
(අ) අතත භාණ්ඩය - ..........................................
(ආ) සුෂිර භාණ්ඩය - ..........................................

**2.** (i) සිංහරාජ වන්නම හෝ අනුරාග දණ්ඩතාලය සින්දු වන්නම හෝ විරාඩි වන්නමට හෝ අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න.

(ii) "පානා අසිරි නොහැර පානා දෙනෙත් කුසුම
බානා පියෙවි බලැති තුංක මේ" මෙම කවි පාදය මාත්‍රා $2 + 3$ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

(iii) සැවුලා වන්නම හෝ මණ්ඩූක වන්නමට අයත් අඩව්වක් හෝ නාතිලිංචි තාලයේ ඉරට්ටිය හෝ ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) දළදා පෙරහැර
(ii) ආංගික අභිනය
(iii) ප්‍රශස්ති කවි
(iv) "කුඹී කථාව" කතාපුවත
(v) නර්තනයෙන් ගොඩනැගෙන සාරධර්ම



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**4.** ශාන්තිකර්මවල චාරිත්‍ර, නර්තන, සැරසිලි එකිනෙකට වෙනස් වූ ලක්ෂණ පිළිබිඹු කරයි.

(i) කොහොඹාකංකාරියේ එන චාරිත්‍ර විධි **පහක්** නම් කරන්න.

(ii) පහතරට දෙවොල් මඩුව ශාන්තිකර්මයේ එන දෙවොල් හෝ පත්තිනි නර්තන අංග පිළිබඳ ඇගයීමක් කරන්න.

(iii) සබරගමු පහන්මඩුවේ සැරසිලි පිළිබඳ විමසීමක් කරන්න.

**5.** දේශීය ජන නාටක අතර සොකරි හා කෝලම් විශේෂ වේ.

(i) කෝලම් නාටකයට අයත් කවියක් ලියා දක්වන්න.

(ii) ගුරුහාමි චරිතය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) සොකරි හා කෝලම් නාටකවල දක්නට ලැබෙන වෙනස්කම් සාකච්ඡා කරන්න.

**6.** (i) පොළොන්නරු යුගයේ නර්තන කලා ඉතිහාසය හා සම්බන්ධ මූලාශ්‍රය **දෙකක්** දක්වන්න.

(ii) කෝට්ටේ යුගයේ සැළලිහිණි සංදේශ කාව්‍යය ඇසුරෙන් නළඟන වැනුම් පිළිබඳ කියැවෙන සාධකයක් ඉදිරිපත් කරන්න.

(iii) කුරුණෑගල යුගයේ නර්තන හා වාදන කලාව පැවති තත්ත්වය මූලාශ්‍රය **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

**7.** පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

(i) **A** රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර රංග වස්ත්‍රාභරණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) **B** රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය කුමක් ද? එහි නිරූපණය වන චරිත හා ඊට සම්බන්ධ නර්තනය පිළිබඳ ඇගයීමක් කරන්න.

(iii) නූතන ප්‍රාසාංගික නර්තන කලාව පහත කරුණු යටතේ විචාරයට ලක් කරන්න.

- රූපවාහිනී නර්තන
- දේශීය අනන්‍යතාවය



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM

# 44 - නැටුම් (දේශීය) - II

| | | | | ලකුණු | |
|---|---|---|---|---|---|
| 1. | (i) | 1972 | | 1 | |
| | (ii) | රම්මොලවක | | 1 | |
| | (iii) | රොබට් නොක්ස් මහතා | | 1 | |
| | (iv) | පින්නල් කෝලාට්ටම් | | 1 | |
| | (v) | අභිනය දර්පනය | | 1 | |
| | (vi) | සෙනසුරු | | 1 | |
| | (vii) | පණ්ඩුකාභය | | 1 | |
| | (viii) | අණ බෙර | | 1 | |
| | (ix) | (අ) | ජිත්, දිත්, නං | 1 | 2 |
| | | (ආ) | තත්, තොං | 1 | |
| | (x) | (අ) | පහතරට බෙරය | 1 | 2 |
| | | (ආ) | හොරණෑව | 1 | |

WWW.OLEVELAPI.COM

(i) සිට (viii) දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් - ලකුණු 08

(ix) සිට (x) දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් - ලකුණු 04

**මුළු ලකුණු (8 + 4) = 12**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

2. (i) සිංහරාජ වන්නම හෝ අනුරාගදණ්ඩතාලය සින්දු වන්නම හෝ වීරාඩි වන්නමට හෝ අයත් බෙරපදය ප්‍රස්තාර කරන්න.

උඩරට නර්තන සම්ප්‍රදාය

බෙර පදය - දොදොංත තකු දොම්

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| දො | දොං | - | ත | ත | කු | දොම් | - | දො | දොං | - | ත | ත | කු | දොම් | - |

පහතරට නර්තන සම්ප්‍රදාය

බෙර පදය - තක දිත් තක දොම් දොම් දිම් තක දොම්

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ත | ක | දිත් | - | ත | ක | දොම් | - | දොම් | - | දිම් | - | ත | ක | දොම් | - |

සබරගමු නර්තන සම්ප්‍රදාය

දවුල් පදය - ජිමිත කුඳා දොම්

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ජි | මි | ත | කු | ඳා | - | දොම් | - | ජි | මි | ත | කු | ඳා | - | දොම් | - |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
බෙර පදය / දවුල් පදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**(ii) ' පානා අසිරි නොහැර පානා දෙනෙත් කුසුම**

**බානා පියෙවි බලැති තුංක මේ ' මෙම කවි පාදය මාත්‍රා 2 + 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.**

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| පා | - | නා | - | අ | සි | රි | නො | හැ | ර |
| පා | - | නා | - | දෙ | නෙත් | - | කු | සු | ම |
| බා | - | නා | - | පි | යෙවි | - | බ | ලැ | ති |
| තුං | ක | මේ | - | - | - | - | - | - | - |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02

කවි පාදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

**(iii) සැවුලා වන්නම හෝ මණ්ඩුක වන්නමට අයත් අඩව්වක් හෝ නාතිලිංවි තාලයේ ඉරට්ටිය හෝ ප්‍රස්තාර කරන්න.**

**උඩරට සැවුලා වන්නමේ අඩව්ව**

| ^ | | / | | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| ජේං | - | තත් | - | තත් | - | ජේං | - | තත් | - | තත් | - |
| ජේං | - | තත් | - | තත් | - | ජේං | - | තා | - | - | - |
| ජේ | නු | තත් | - | තත් | - | ජේ | නු | තත් | - | තත් | - |
| ජේ | නු | තත් | - | තත් | - | ජේ | නු | තා | - | - | - |
| ජේං | - | තත් | - | තත් | - | ජේං | - | තා | - | - | - |
| ජේ | නු | තත් | - | තත් | - | ජේ | නු | තා | - | - | - |
| ජේං | - | තා | - | - | - | ජේ | නු | තා | - | - | - |
| දොහො | කඩ | තා | - | - | - | දොහො | කඩ | ග | ත | කු | ඳ |
| දොහො | කඩ | තා | | | | | | | | | |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**පහතරට නාතිලිංචි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය**

| ∧ | | / | | | | ∧ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| දොමි | - | තත් | - | දිමි | - | ග |ත | ගු | ගු | දි | ත |
| ග | ත | ගුඹි | තිග | දිරි | කිට | දොමි | - | ග | ත | ග | ත |
| ගුම් | - | දා | | | | | | | | | |

**සබරගමු මණ්ඩුක වන්නමේ අඩව්ව**

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | ති | ත | ග | ත | දොමි | - |
| ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | ග | ත | දොමි | - |
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | | | | | | | | | | | | | |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
ඉරට්ටිය/අඩව්ව ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

**මුළු ලකුණු (4 x 3) = 12**

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**3. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.**

**(i) දළදා පෙරහැර :-**

- මහනුවර දළදා පෙරහැර සෞන්දර්යාත්මක වටිනාකමින් යුතු සංස්කෘතික අංගවලින් සමන්විත වන බව.
- කුඹල්, රන්දෝලි පෙරහැර වශයෙන් වීදි සංචාරය කරන බව.
- සතර දේවාල පෙරහැර හා සම්බන්ධ වන බව.
- පෙරහැර අලංකාර කරගැනීම සඳහා යොදාගන්නා මෙවලම්, අලි ඇතුන්, පොල් පන්දම්, සැරසිලි ඇතුළු විවිධාංග නිසා චමත්කාරය වැඩිවන බව.
- නරඹන්නන්ගේ රස විඳීම සඳහා නර්තන, වාදන ශිල්පීන් සුවිශේෂ අවස්ථා ඉදිරිපත් කරන බව.
- කප් සිටුවීමේ සිට දිය කැපීම දක්වා චාරිත්‍ර සිදුකරන බව.

ඉහත කරුණුවලින් **<u>හතරක්</u>** වත් ලියා තිබේ නම්
**ලකුණු** 04

**(ii) ආංගික අභිනය :-**

- සතර අභිනයට අයත් වන බව.
- නර්තනයක්, නාට්‍යයක කතාවක් හෝ සිද්ධියක් හෝ නළුවාගේ මාර්ගයෙන් ඉදිරියට ගෙන එන ප්‍රධාන මෙවලම ආංගික අභිනය බව.
- අංග, ප්‍රත්‍යාංග හා උපාංග වශයෙන් ආංගික අභිනය කොටස් කරන බව.
- වචනයෙන් භාවිතා කිරීමට නොහැකි බොහෝ දේ ආංගික අභිනය මගින් ප්‍රකාශ කළ හැකි බව.
- අඟ පසඟ හා හස්ත මුද්‍රා මෙන්ම සංචලනද ආංගික අභිනයට අයත් වන බව.

ඉහත කරුණුවලින් **<u>හතරක්</u>** වත් ලියා තිබේ නම්
**ලකුණු** 04

**(iii) ප්‍රශස්ති කවි :-**

- බුදුන්, දෙවියන්, රජවරුන් සහ රදල ප්‍රභූන් ආදීන්ගේ ගුණ වර්ණනා කරන කාව්‍ය ප්‍රශස්ති කාව්‍ය ලෙස හඳුන්වන බව.
- පැරකුම්බා සිරිත මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍ය ලෙස පිළිගැනෙන බව.
- ශ්‍රී නාමය. පවන, ශෘංගාලංකාරය ....... ආදී තවත් ප්‍රශස්ති කාව්‍ය ග්‍රන්ථ ඇති බව.
- ප්‍රශස්ති කාව්‍ය ගායනා කරන ලද ගායකයෝ වන්දිභට්ටයන් ලෙස හඳුන්වන බව.
- ප්‍රශස්ති කාව්‍ය වඩාත්ම ජනප්‍රිය වී ඇත්තේ මහනුවර යුගයේදී බව.
- ප්‍රශස්ති කාව්‍ය කවිකාර මඩුවේදී ගායනා කර ඇති බව.
- රාජ ප්‍රශස්ති, බුද්ධ ප්‍රශස්ති, දේව ප්‍රශස්ති යනුවෙන් ප්‍රශස්ති වර්ගීකරණය කර ඇති බව.

WWW.OLEVELAPI.COM

ඉහත කරුණුවලින් **<u>හතරක්</u>** වත් ලියා තිබේ නම්
**ලකුණු** 04

**(iv) කුඹි කතාව :-**

- දිනක් කුහුඹු පවුලක් තම රාජ්‍යයෙන් ඈතට කෑම සෙවීම සඳහා පිටත් වේ.
- මදුරුවෙක් පැමිණ කුහුඹින්ගේ නිවාස කඩා බිඳ දමයි.
- කුහුඹින් නැවත පැමිණ තම රාජධානිය ගොඩ නගයි.
- කුහුඹින් අසල්වැසි යහළුවන්ට තේ පැන් සාදයක් සූදානම් කරයි.
- මහ වැස්සක් ඇද හැලී මුලු ප්‍රදේශයම ජලයෙන් යට වේ.
- පියාපත් ඇති අය ඉගිලී යයි. කුහුඹුවෝ ඇතුලු අනෙකුත් අය ටින් එක උඩට නැග බලා හිඳී.
- පණ බේරා ගැනීමට දඟලන මදුරුවාද කුහුඹින් විසින් බේරා ගනී.

කතා පුවත විස්තර කර තිබේ නම්
**ලකුණු** 04



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**(v) නර්තනයෙන් ගොඩ නැගෙන සාරධර්ම :-**

- නර්තනය මගින් ඉවසීම, දැරීම, සමානාත්ම සංකල්පය, නායකත්වයට ගරුකිරීම, එකමුතුව වැඩ කිරීම ....... ආදී වටිනාකම් රාශියක් ජීවිතයට එකතුවන බව.
- තම හෘද සාක්ෂියට අනුව කටයුතු කිරීමට හැකි වන බව.
- ජීවිතයේ හමුවන ඕනෑම අභියෝගයකට මුහුණ දීමට හැකි වන බව.
- වැඩිහිටියන්ට ගුරුවරුන්ට ගරු කිරීම.
- නර්තන ආරම්භය හා අවසානයේ ගුරුවරයාට වැඳීම.
- ශාන්ති කර්ම භූමියේදී සිදුකරන සාරධර්ම.

ඉහත කරුණුවලින් **හතරක්** වත් ලියා තිබේ නම්
**ලකුණු** 04

**මෙයින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියා ඇත්නම් මුළු ලකුණු (4 x 3) = 12**

04. **ශාන්තිකර්මවල චාරිත්‍ර, නර්තන, සැරසිලි එකිනෙකට වෙනස් වූ ලක්ෂණ පිළිබිඹු කරයි.**

**(i) කොහොඹා කංකාරියේ එන චාරිත්‍ර විධි පහක් නම් කරන්න.**

- ආරාධනය
- කරල් හා අක්යාල වෙන්කිරීම
- කප් සිටුවීම
- මඩු පේ කිරීම
- තොට පේ කිරීම
- මල පේ කිරීම
- අයිලේ යැදීම ..... ආදී වශයෙන් පහක් නම් කර ඇත්නම් ලකුණු 04

**(ii) පහතරට දෙවොල් මඩු ශාන්තිකර්මයේ එන දෙවොල් හෝ පත්තිනි නර්තන අංග පිළිබඳ ඇගයීමක් කරන්න.**

- දෙවොල්
  දෙවොල් දෙවියන් ලංකාවට ගොඩබැසීම පිළිබඳ විද්‍යාමාන බව
  ගායනය සහිත ශාස්ත්‍රීය නර්තන අංගයක් බව
  රක්ත වර්ණයට ආවේනික ඇඳුම් කට්ටලයක් ඇති බව
  දෙවොල් පද ඇතුළත් සාමූහික නර්තන අංගයක් බව

- පත්තිනි
  ගායනය සහිත ශාස්ත්‍රීය නර්තන අංගයක් බව
  දේව සංකල්පය ඉස්මතු වන බව
  විචිත්‍රවත් ඇඳුම් කට්ටලයක් භාවිත කරන බව
  ස්ත්‍රී ලාලිත්‍ය දනවන නර්තන අංගයක් බව
  පද හතකින් සමන්විත වන බව
  සලඹ සහ සළුව අතැතිව ආශිර්වාද කෙරෙන බව

මෙයින් එකක් විස්තර කර ඇත්නම් ලකුණු 04

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**(iii) සබරගමු පහන්මඩුවේ සැරසිලි පිළිබඳ විමසීමක් කරන්න**

ප්‍රධාන තොරණ, මඩුව, කාලපන්දම් ගස, මල්යහන, බිසෝකප .....

ඉහත සැරසිලි දෙකක් පිළිබඳව විමසීමක් කර ඇත්නම් ලකුණු 04

**මුළු ලකුණු (4 x 3) = 12**

05. **දේශීය ජනනාටක අතර සොකරි හා කෝලම් විශේෂ වේ.**

**(i) කෝලම් නාටකයට අයත් කවියක් ලියා දක්වන්න.**

- කෝලම් නාටකයේ චරිතවලට අදාළ කවියක් ලියා ඇත්නම් ......

ලකුණු 04

**(ii) ගුරුහාමි චරිතය පිළිබඳ විග්‍රහයක් කරන්න.**

- ගුරුහාමි ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ සිට පැමිණි තැනැත්තෙකු බව.
- සොකරියගේ ස්වාමිපුරුෂයා ලෙස ප්‍රධාන චරිතයක් ඉදිරිපත් කරන බව.
- ගුරුහාමිගේ රංග වස්ත්‍රාභරණය උඩරට වෙස් ඇඳුම ඇසුරෙන් නිර්මාණය කර ඇති බව.
- හිසට මුණ්ඩාසනය, දෑතේ දෙපයේ සහ පපුවේ මෙන්ම නළලේ සුදු ඉරි ඇඳ භාරතීය ලක්ෂණ ප්‍රදර්ශනය වන බව.

කරුණු හතරක් විග්‍රහ කර ඇත්නම් **ලකුණු** 04

**(iii) සොකරි හා කෝලම් නාටකවල දක්නට ලැබෙන වෙනස්කම් සාකච්ඡා කරන්න.**

- උඩරට හා පහතරට ප්‍රදේශයන්ට ආවේණික ජන නාටකයක් බව.
- නාටකවල පැවැත්වීමේ අරමුණු අතර වෙනස්කම් ඇති බව.
- සොකරි නාටකය සඳහා සරල පද භාවිතය, කෝලම් නාටකයේ දී ශාස්ත්‍රීය පද යොදාගන්නා බව.
- කෝලම් රඟමඩල 'තානායම්පොල' නමින් හඳුන්වන බව හා සොකරි රඟමඩලට 'කමත' යොදාගන්නා බව.
- භාවිතයේ දී වාද්‍ය භාණ්ඩවල වෙනස්කම් ඇති බව.
- පළඳින වෙස් මුහුණුවල නිර්මාණයේ හා භාවිතයේ වෙනස්කම් ඇති බව.
- ගායනාවල වෙනස්කම් ඇති බව.

ආදි කරුණු හතරක් සාකච්ඡා කර ඇත්නම් ලකුණු 04

**මුළු ලකුණු (4 x 3) = 12**



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

06.

**(i) පොළොන්නරු යුගයේ නර්තන කලා ඉතිහාසය හා සම්බන්ධ මූලාශ්‍රය දෙකක් දක්වන්න.**

වංශ කතා, සෙල් ලිපි, මූර්ති, රූකම්

- මහා පරාක්‍රමබාහු රජු විසින් සරස්වතී මණ්ඩපය ඉදිකිරීම පිළිබඳව චූලවංශයේ දැක්වෙන බව.
- මහා පරාක්‍රමබාහු රජුගේ හමුදාවේ සෙබලුන්ගේ ආස්වාදය උදෙසා නැටුම්, ගැයුම් කරවූ බව චූලවංශයේ සඳහන් වන බව.
- අංක 2 දරන ශිව දේවාලයෙන් නටරාජා මූර්තියක් සොයාගන්නා ලද බව.
- පොළොන්නරු යුගයේ සැටදා ගෙයි බිත්ති දෙපස රූකම් දක්වා ඇති බව.
- පාලමොට්ටායි සෙල්ලිපියේ දේවදාසීන් පිළිබඳව සඳහන් වන බව.

එක් මූලාශ්‍රයකට ලකුණු 02 බැගින් ලකුණු 04

**(ii) කෝට්ටේ යුගයේ සැළලිහිනි සංදේශ කාව්‍යය ඇසුරෙන් නළඟන වැනුම් පිළිබඳ කියැවෙන සාධකයක් ඉදිරිපත් කරන්න.**

- "විදෙන ලෙලෙන නරුබර" .......
- "ලකල පුළුලු කුල බඳමිණි".......

සාධකය සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු 04

**(iii) කුරුණෑගල යුගයේ නර්තන හා වාදන කලාව පැවති තත්ත්වය මූලාශ්‍රය දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න**

- සිංහල ථූපවංශය

  "ගැට බෙර, පනා බෙර, එකැස් බෙර, මිහිගු බෙර" ........ මින් සමහර භාණ්ඩ යුද්ධ කටයුතුවලදී භාවිතා කරන බව.

- දළඳා සිරිත

  "සක් පංඥ්ච, දළහං, මද්දල, මහමකුඩම්, පනා බෙර" ........

  රිදී විහාරයේ දොරේ ඇති ඇත් දත් කැටයම්වල නළඟන රූප දක්නට ඇති බව.

- සිංහල උම්මග්ග ජාතකය

  "ඒ වේදේහ රජුගේ විධානයෙන් ආතත, විතත, විතතාතය, ඝනය, සුසිරය යනාදී පංචාංග තූර්ය නාද පැවැත්වූහ" .... දැක්වෙන බව.

මූලාශ්‍රය දෙකට ලකුණු 02
පැහැදිලි කිරීමට ලකුණු 02
ලකුණු 04

**මුළු ලකුණු (4 x 3) = 12**



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

07.

**(i) A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම්කර රංග වස්ත්‍රාභරණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.**

- ❖ කතකලි
  - රංග වස්ත්‍රාභරණ - ක්‍රීටම් - හිස් ඔටුන්න
    - කළුතාරම් - කරට පළඳින මාල
    - කුප්පායම් - උඩු කයට අඳින අත් දිග හැට්ටය
    - උත්තරීයම් - කර වටා ඉණ දක්වා එල්ලා ඇති රතු සුදු පටි
    - ශෙඩ්ර් - යටිකයට අඳින විශාල රෙද්දකි

සම්ප්‍රදාය නම් කිරීමට ලකුණු 01
රංග වස්ත්‍රාභරණ තුනක් පිළිබඳ හැඳින්වීමක් කර ඇත්නම් ලකුණු 03
ලකුණු 04

**(ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය කුමක්ද? එහි නිරූපණය වන චරිත හා ඊට සම්බන්ධ නර්තනය පිළිබඳ ඇගයීමක් කරන්න.**

- ❖ මණිපුරි
  - නිරූපණය වන චරිත වනුයේ රාධා ක්‍රිෂ්ණා බව.
  - රාධා ක්‍රිෂ්ණාගේ ප්‍රේම වෘත්තාන්තය තේමා කරගනිමින් නර්තන නිර්මාණය කර ඇති බව.
  - රාස්ලීලා (මහාරාස්, වසන්ත රාස්, කුංජරාස්, නෘත්‍ය රාස්, පංචරාස්) නර්තන අංග ඇති බව.

සම්ප්‍රදාය නම් කිරීමට ලකුණු 01
රාධා ක්‍රිෂ්ණාගේ චරිත දෙක ලියා ඇත්නම් ලකුණු 01
මෙම කරුණු ඇසුරෙන් ඇගයීමක් කර ඇත්නම් ලකුණු 02
ලකුණු 04

**(iii) නූතන ප්‍රාසාංගික නර්තන කලාව පහත කරුණු යටතේ විචාරයට ලක් කරන්න.**

**රූපවාහිනී නර්තන**

- සංචලන, පැහැසරණිය, මුතුහර ...... වැනි රූපවාහිනී වැඩසටහන් වලින් ප්‍රාසාංගික නර්තන පිළිබඳව විකාශනය කෙරෙන බව.
- දෙරණ, හිරු, ITN, ජාතික රූපවාහිනිය, සිරස ...... ආදී නාලිකාවල රියැලිටි වැඩසටහන් ඇති බව.

WWW.OLEVELAPI.COM

**දේශීය අනන්‍යතාවය**

- ශාස්ත්‍රීය නර්තන ප්‍රාසාංගික වේදිකාවට ගෙන එන බව.
- දේශීය නර්තන සම්ප්‍රදායන්වලට විදේශීය නර්තන ලක්ෂණ සුසංයෝග වන බව.
- ප්‍රාසංගික බව ඉස්මතු කිරීමේදී දේශීයත්වය යටපත් වන බව.
- ඇඳුම් පැළඳුම්වල විචිත්‍රත්වය නිසා දේශීය අනන්‍යතාවය ගිලිහී ඇති බව.
- දේශීයත්වය ආරක්ෂා කෙරෙන අයුරින් ලෝක ප්‍රජාවට ප්‍රාසංගික නර්තන නිර්මාණ ප්‍රදර්ශනය කෙරෙන බව.

කරුණු දෙක යටතේ විචාරයට ලක්කර ඇත්නම් ලකුණු 02 බැගින් ලකුණු 04

**මුළු ලකුණු (4 x 3) = 12**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....